
## බුද්ධිමත් තැනැත්තා රන් රුවන් සේ බැබළේ



### මනෝ ගේ දේශපාලන ලෝකය

# මෙත්තානන්ද දේශපාලනය

මනෝජ් අබයදීර



සත් මුහුදින් එපිට ගුගුරුවා
බත දොයි උගුරු දණ්ඩ
සත් දෙවිවරු බලා ඉද්දි
සුද්දෝ ආවේ රට කරන්න
මහත්වරුණි දන්නවාද
සුද්දෝ ආවේ රට කරන්න.

රත්න ශ්‍රී විජේසිංහ ලියූ සුනිල් එදිරිසිංහ ගයන මේ ගීතයෙන් රචනය ආරම්භ කළ යුතු යැයි සිතුනේ ගීතයේ අලුත් බව නිසාම පමණක් නොවේ. "රට කරන්න" කියා සුද්දෝ පැමිණි ගමනකින් වසර 500 කට පසු අප සිටිනා තැන පිළිබඳව මේ ගීතය හෙළනා අතීතාවර්ජණයද ඊට හේතුවක් විය. ව්‍යවහාරයේ පවතින පරිදි 1505 පෘතුගීසීන් ලක්දිවට පා තැබීමත් සමඟ ගතවූ වසර පන්සියය පුරාවට මෙරට මුහුණ දුන් නොවහල් බව අහිමි වීමේ අර්බුදය තවමත් ඉතිරිව පවතී.

පෘතුගීසීන්ට එරෙහිව සීතාවක රාජසිංහ රජතුමා, වීදිය බණ්ඩාර, කුසුමාසන දේවිය, විමලධර්ම සූරිය රජතුමා ද ඉංග්‍රීසින්ට එරෙහිව 1818 සිට අරගල කළ ජාතික නායකයන්ද, අනගාරික ධර්මපාලතුමා, කුමාරතුංග මුනිදාස වැනි ඩොමීනියන් තත්ත්වය ලැබීමට පෙර සිටි ජාතික ව්‍යාපාරයේ නායකයන්ද මේ තත්ත්වය මනාව තේරුම් ගෙන සිටියහ. ඔවුන් උත්සාහ කළේ 1815 නැති වූ නිදහස ලබා ගැනීමටය. නිදහස නැති ජාතියක් ලබා ගැනීමට සටන් කළ යුත්තේ තමන්ට නැතිවූ නිදහසය යන්න අලුතෙන් ඉගැන්විය යුතු කාරණයක් නොවේ. මේ උත්සාහය අතරතුර ලංකාවට අමුතුම තත්ත්වයේ නිදහසක් උදාවිය. ඒ ඩොමීනියන් තත්ත්වයය. එය එක්තරා අන්දමක දේශපාලන නිදහසක් පමණක් විය. සර්ව ජන ඡන්දයෙන් තමනට කැමැති නියෝජිතයන් ලක්වාසීන්ට පත් කළ හැකි වුවත් එසේ පත් කර ගන්නා ආණ්ඩු ක්‍රමය ලක්වාසීන්ගේ එකක් නොවීය. එය සුද්දන් විසින් තමන්ගේ අධිරාජ්‍යවාදය පාලනය කර ගැනීම සඳහා යෙදූ දුරස්ථ පාලකයක් විය. ඩොමීනියන් තත්ත්වයෙන් මෙරට නිදහස අර්ථවත් නොවීය. අනෙකක් තබා යුක්තිය පසිඳලීමේ අවසාන ස්ථානය පවා ඩොමීනියන් තත්ත්වය තුළ රැඳුනේ බ්‍රිතාන්‍ය මහ රැජනගේ ප්‍රිවි කවුන්සිලය තුළය.

ලක් දේශපාලන ඉතිහාසයේ තේරුම් ගත යුතු තැනක් එලඹෙන්නේ මේ ඩොමීනියන් තත්ත්වය ඇතිවීමත් සමඟය. ලංකා ජාතික සංගමය ආදී එකතුන් තුළ සුදු අධිරාජ්‍යවාදයේන් එක්තරා දුරකට ආශීර්වාද ලැබූ පිරිසක් ලක්දිවට යම් නිදහසක් ලබා ගැනීමේ ව්‍යාපාරයකට අත ගසා තිබිණි. මොවුන් බලාපොරොත්තු වූයේ 1815 දී අහිමි වූ නිදහස යළි ලබා ගැනීමට නොවේ. බටහිර අධ්‍යාපනයෙන් ඔලු පුරවාගත් ඔවුන් බලාපොරොත්තු වුණේ පොඩි කූඩුවෙන් ලොකු කූඩුවකට යැමටයි. කූඩුවෙන් එළියට යැමේ කිසිම තැතක් ඔවුන් නොදැරුවේය. 1948 දී ඩොමීනියන් තත්ත්වය සුද්දෝ ප්‍රදානය කරන්නේද මොවුන්ටමය.

ඕල්කට් ආගමනයත් සමඟ සුදු ජාතිකයන්ගේ මූලිකත්වයෙන් පරම විඥානාර්ථ වාදීන් නම් පිරිසක් අධ්‍යාපනය තුළ යම් කටයුත්තක් කිරීමට වෑයම් කළහ. එය බොහෝ දුරට ඉංග්‍රීසියෙන් බුදු දහම ඉගැන්වීමට සීමා විය. එයද සිදුකෙරුණේ බටහිර අධ්‍යාපන මාදිලිය තුළය. 1815 ට පෙර මෙරට තිබූ අධ්‍යාපන මධ්‍යස්ථානය වූ පිරිවෙනක් ඇතිකිරීමටවත් මොවුන් වැර වෑයම් නොකළහ. මෙයද නිදහස් ව්‍යාපාරයක් ලෙස සමහරු තේරුම්ගෙන තිබුණහ. මේ ව්‍යාපාරයේ අවම වශයෙන් මෙරට අධ්‍යාපනය හෝ නොවහල් කර ගැනීමට තරම් ජවයක්වත් නොසැලසුණි.

1933 දී කොළඹ දකුණේ තරුණ සංගමය විසින් සූරිය මල් ව්‍යාපාරය ආරම්භ කිරීමත් සමඟ 'නිදහස' දිනා ගැනීමේ තවත් ව්‍යාපාරයකට මුල් ගල තැබිණි. 1935 දෙසැම්බර් 18 වැනි දින ලංකා සම සමාජ පක්ෂය නමින් බිහිවන්නේ එම ව්‍යාපාරයය. අමරිකාවේ හෝ බ්‍රිතාන්‍යයේ ඉගැනුම ලැබූ පිරිසක් වූ මෙම ව්‍යාපාරයේ නායකයෝ, මාක්ස්වාදීන් වූහ. තමන් ඉගෙනුම් සඳහා ගිය රටවලදී මාක්ස්වාදය හැදෑරූ මොවුන් අධිරාජ්‍යවාදයට එරෙහිව සටන් කිරීමට කම්කරු ගොවි බලවේගය සංවිධානය කරමින් සිටියේය. මොවුන් අධිරාජ්‍ය වාදයට දේශපාලනිකව හා ආර්ථිකව එදිරි වුවද සංස්කෘතිකව නොවීය. වෙනකක් තබා සුද්දන්ට එරෙහිව මොවුන් සටන් කළේද කාල්මාක්ස් නම් සුද්දාගේ සූත්‍ර අනුවය. මාක්ස්වාදය ලංකාවට ගලප්පනවා යැයි හරුප දෙසමින් ගිය මේ පිරිස ආර්ථික නිදහස හා දේශපාලන නිදහස ලබා ගැනීම සඳහා යම් අරගලයක් දියත් කළහ.

ඉහත ඇතිවූ තුන් පිරිසම "රට කරන්න ආ සුද්දනට" එරෙහිව සටන් කළේ සුද්දෝ තුළම හිඳිමින්ය. එසේම ඒ 1815 නැතිවූ නිදහස දිනා ගැනීම ඒ කිසිවකුගේ ඉලක්කය නොවීය.

දේශපාලන, සංස්කෘතික, ආර්ථික නිදහස මුළුමනින්ම දිනා ගනු වෙනුවට මේ අංග තුනෙන් ආර්ථික හා දේශපාලන නිදහස දිනා ගැනීමට සමහරු උත්සාහ කළ නමුත් කිසිවෙක් සංස්කෘතික නිදහස දිනා ගැනීමට කටයුතු නොකළහ.

ආර්ථික, දේශපාලන, සංස්කෘතික නිදහස ඉලක්ක කර ගනිමින් 1815 නැතිවූ නිදහස දිනා ගැනීම සඳහා සටන් කළේ ජාතික ව්‍යාපාරය පමණි. ඩොමීනියන් තත්ත්වය ලැබුණු පසු එක් පිරිසක පැතූ නිදහස එයින් ලැබුණි. නමුත් මාක්ස්වාදීන් හා ජාතික ව්‍යාපාරය බලාපොරොත්තු වූ නිදහස එයින් නොලැබිණි. මේ නිසා මේ දෙපිරිසම නිදහස උදෙසා සටන් කරන්නට විය.

රචනයේ මාතෘකාවට පැමිණෙන්නේ දැන්ය ලොකුසක හේවගේ මෙත්තානන්ද, 1894 මාර්තු 19 වැනි දින අම්බලන්ගොඩ කලුවඩුමුල්ල ගමේදී උපත ලැබීය. පසුගිය ඉරිදා ඔහුගේ ජන්ම දිනය යෙදී තිබිණි. ඔහු ජීවත්ව සිටියා නම් ඔහුට වයස අවුරුදු 112 කි.

මෙත්තානන්දයන් යනු කවුරුන් ද ?

ඒ ගැන සැකෙවින් කිවහොත් මහාවංශයේ ධර්මපාල පරිච්ඡේදයේ ඉහළින්ම ලියවෙන වීරයෙකි.

එල්. එච්. මෙත්තානන්දයන් රජයේ ගුරු විදුහලෙන් පුහුණුව ලැබූ ගුරුවරයෙක් විය. ඒ හැරුණු විට ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය හා අධ්‍යාපන ඩිප්ලෝමාවක් ඔහු ලබා තිබිණි. ඔහු විශිෂ්ට අධ්‍යාපනඥයකු විය. නමුත් ඔහුට රට ණය වන්නේ ඒ කිසිවක් නිසාවත් නොවේ. ඔහුගේ දේශපාලනය නිසාය. මෙත්තානන්දයන් ගේ දේශපාලන යැයි කිව්වාට ඔහු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්වත් නොවීය. නමුත් ඔහු ජාතික ව්‍යාපාරය තුළ කළ කී දෑ මෙරට දේශපාලනයේ විසල් පෙරළියක් සිදු කළේය. ලිබරල්වාදී පක්ෂයක් වූ ශ්‍රී.ල.නි.ප. ය ජාතිකත්වයේ පක්ෂය බවට පත් කළේ ඒ දේශපාලනයය. ස්වභාෂා රාජ්‍ය භාෂා විය යුතු යැයි කියූ ශ්‍රී.ල.නි.ප. ය එජාප දෙපිරිසම සිංහ පමණක් රාජ්‍ය භාෂාව විය යුතු යැයි කිව්වේ මෙත්තානන්දයන්ගේ දේශපාලනය නිසාය. 56 මහ මැතිවරණයේදී ප්‍රධාන පාඨය බවට පත්වන්නේ මෙයය.

1952 මහ මැතිවරණයේ සිංහල දෙමළ භාෂා දෙකම රාජ්‍ය භාෂා ලෙස පිළිගත් ශ්‍රී.ල.නි.ප. යට මුලින්ම මෙත්තානන්දයන්ගේ ජාතික බලවේගයේ දේශපාලනය කරණ කොට ගෙන සිංහල පමණක් රාජ්‍ය භාෂාව කරනා ප්‍රතිපත්තියට පැමිණීමට සිදුවිය. මේ කටයුත්තේදී බද්දේගම විමලවංශ හිමියෝද මෙත්තානන්දයන් හා කටයුතු කළහ. 1815 නැතිවූ නිදහස දිනා ගැනීම සඳහා යන ගමනේදී මෙත්තානන්දයන් ලැබූ පලමු ජයග්‍රහණය වූයේ එයය.

බෞද්ධ තොරතුරු පරීක්ෂණ සභාව පත් කිරීමට නායකත්වය ලබාදීම මෙත්තානන්දයන් 1815 නැතිවූ නිදහස ලබා ගැනීම සඳහා කළ තවත් සටනක ප්‍රතිඵලයකි. එල්. එච්. මෙත්තානන්දයන් මෙම පරීක්ෂක සභාවේ සාමාජිකයකු ද විය. 56 මහ මැතිවරණයට ඔන්න මෙන්න කියා තිබියදී 1956 පෙබරවාරි 04 දින කොළඹ ආනන්ද විදුහලේදී මහා සංඝරත්නය ප්‍රමුඛ ජනතාවට එම පිළිගන්වනු ලැබීය. වාර්තාව ඉදිරිපත් කර සතියකට පසු පාර්ලිමේන්තුව විසුරුවා හැරියේය. බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාවේ යෝජනා ඇතුළත් කර දස පනතක් කොළඹ නගර ශාලාවේදී එක්සත් භික්ෂු පෙරමුණ ඉදිරිපත් කළේය. මීළඟ මහ මැතිවරණයේදී තමන් බලයට පත්වුවහොත් 'දස පනත' ක්‍රියාත්මක කරන බවට එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ප්‍රතිඥා දුන්නේය.

56 ම.එ.පෙ. බලයට පත්වීමේ දේශපාලනය සිදුවන්නේ මේ අනුවය. මෙත්තානන්දයන්ගේ ජාතික ව්‍යාපාරයේ යෙදෙමින් 1815 නැතිවූ නිදහස දිනා ගැනීමට උත්සාහ කළේ එසේය.

එල්. එච්. මෙත්තානන්දයන්ගේ දේශපාලනය සුවිශේෂ වන්නේ ඔහු ජාතික ව්‍යාපාරයේ නිරත වන කාලයත් සමඟය. එක්දහස් නවසිය හතළිස් ගණන්වලදී අධිරාජ්‍යවාදී විරෝධීන් බොහෝ දෙනකුගේ දේශපාලනය වූයේ මාක්ස්වාදයය. ඔවුන් අධිරාජ්‍යවාදයට එරෙහි වූයේ අධිරාජ්‍යවාදී රටවලින්ම උපන් මතවාද තුළිනි. එම කාලයේ මාක්ස්වාදයට එරෙහිව සිටියේ නිරත වූ දේශපාලනය වූයේ ලිබරල්වාදය වැනි තවත් විජාතික මතවාදී දේශපාලනයන් තුළය. මෙත්තානන්දයන් මේ සියල්ල අතරේ දියෙන් කිරි වෙන්කර ගන්නා රාජහංසයකු සේ ජාතික ව්‍යාපාරයේ මාවත තෝරා ගත්තේය. අනගාරික ධර්මපාලතුමා, කුමාරතුංග මුනිදාසයන්, පියදාස සිරිසේනයන් ආදීන් සමඟ භික්ෂු පරපුර ජාතික ව්‍යාපාරයේ නිරත වූ මහ මෙත්තානන්දයන් පැහැදිලිව තේරුම් ගත්තේය. 56 දී තමන්ගේ මූලිකත්වයෙන් බලයට පත්කළ ආණ්ඩුවේ අධ්‍යාපන ඇමැති තනතුරට මෙත්තානන්දයන්ගේ නම එක්සත් භික්ෂු පෙරමුණ යෝජනා කළද ඔහු එම තනතුර ප්‍රතික්ෂේප කළේය. අගමැති බණ්ඩාරනායක බුරුමයේ තානාපති තනතුරට මෙත්තානන්දයන් නම් කළ මොහොතේ "මට වැඩ කරන්න තියෙන්නේ ලංකාවේ" කියමින් ඔහු එම තනතුරද ප්‍රතික්ෂේප කළේය.

56 ආණ්ඩුව 1815 දී නැති වූ නිදහස ලබා ගන්නවා වෙනුවට වෙනත් ගමනක නිරතවනු දුටු මෙත්තානන්දයන් ඊට එරෙහිව නොබියව කතා කළේය. කතා කිරීමෙන් පමණක් නොනැවතුණු ඔහු ධර්ම සමාජ පක්ෂය බිහිකර ගත්තේය. 56 ජයග්‍රහණය රටට ලබාදීමේදී මෙත්තානන්දයන් කළ කාර්ය භාරය නොවන්නට එය තවත් මැතිවරණ ජයග්‍රහණයක් පමණක් වන්නට තිබිණි. 56 ජාතික ව්‍යාපාරයේ මං සලකුණක් වූයේ මෙත්තානන්දයන්, එන්. කිව් දියෙස් සූරීන් ඇතුළු එක්සත් භික්ෂු පෙරමුණේ ව්‍යායාමය නිසාය. මේ ව්‍යායාමයට ජාතික මතවාදය එක් කළේ මෙත්තානන්දයන්ය. ඒ නිසාවෙන් 56 පියාවන්නේ මෙත්තානන්දයන්ය.

56 න් පනස් වසරක් ගත වන මේ මොහොතේ මෙත්තානන්ද මෙහෙවර ආවර්ජනය කිරීමෙන් පමණක් ජාතියට සැහීමට පත්විය නොහැක. මෙත්තානන්දයන් ගේ සටනේ අවසාන ඉලක්කය වූයේ 1815 දී නැතිවූ නිදහස යළි දිනා ගැනීමය. එනම් "රට කරවන්න ආ සුද්දන්ගේ "කාර්ය මුළුමනින්ම නිමා කිරීමය. ආර්ථික, දේශපාලනික, සංස්කෘතික ජාතිය නොවහල් කර ගැනීම මෙත්තානන්දයන්ගේ අරමුණ විය. ලොරෙන්සෝද අල්මේද, රොබට් බ්‍රවුන්රිග්, ජෝන් ඩොයිලි, සුද්දන්ගේ සිට අයිවර් ජෙනිංග්ස් සොල්බරි සුද්දා දක්වාද, කාල් මාක්ස්, එංගල්ස් ආදී සුද්දන්ද ඇතුළුව සියලු සුද්දන්ගෙන් මතවාදීව නොවහල් වීම නිදහසේ ඇරඹුම බව මෙත්තානන්දයන් පිළිගත්තේය.

***"මෙත්තානන්ද මහතාගේ මුළු ජීවිතයම එකම සටනක් වී යැයි කීම නිවැරදිය. එය සිය ජීවිත සටනට සීමා වූවත් නොවීය. ජාතිය සංස්කෘතිය නිවහල් කරලීමේ සටනකි මෙරට ජාතිකත්වයට වැදී තිබුණු පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි වැනි විදේශීය සායම් ඉවත් කරලීමෙහි ඔහු නොනැවතී සටන් කළේය. ඒ සඳහා ජනතා සහයෝගය ලබා ගැනීමෙහිද සටන් කළේය. ඒ සඳහා ඇතැම් විටෙක උග්‍ර සටනක යෙදීමටද ඔහුට සිදුවිය.*** 1967 නොවැම්බර් 03 දින දිනමිණ පුවත්පතට පිලිප් ගුණවර්ධන ලියූ ලිපියක මෙත්තානන්දයන් ගැන සඳහන් කළේ එසේය.

උස් නිදහස පතන දේශයක ජනතාව ලෙස, 56 න් පනස් වසරක් ගතවන මේ මොහොතේ, පනස් හයේ පියා වන මෙත්තානන්දයන්ගෙන් ගත යුතු ආදර්ශය වන්නේ අපේ නිදහසට අපේ මගක් යන්නය. සකලාංගයන්ගෙන්ම නොවහල් වීමට අවශ්‍ය වන්නේ එය බව මෙත්තානන්ද යන්ගෙන් අදට ගත හැකි ආදර්ශය විය. ඒ සඳහා නෝර්වේ සුද්දන්ද ඇතුළුව සුද්දන්ගේ බලපෑම්, මතවාද වලින් මිදීමය.

රචනය ආරම්භ සටහන් කළ ගීතය නිමාවන්නේ

මහත්වරුනි, දන්නවාද අදත් එනවා රට කරන්න යනුවෙනි. මෙත්තානන්දයන්ගේ මඟ අප නොගතහොත් තව වසර 500 කින් එන පරපුර ද මේ ගීතය මෙලෙසම ගයනු ඇත.

